// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 2098/24 - 2018 නොවැම්බර් මස 23 වැනි සිකුරාදා - 2018.11.23
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ (1) වගන්තිය යටතේ මුතූර් ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

අවසර ලබා නොගෙන සභාවේ අනුගාමී රැස්වීම් වාර තුනකට සහභාගී නොවීම හේතුකොට ගෙන මුතූර් ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වන වගන්තිය යටතේ මුතූර් ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ කිරුබයිරාජා සත්‍යරූබන් අයත් වන්නා වූ අකිල ඉලංකෙයි තමිල් කොංග්‍රස් නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම මුතූර් ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරිමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා නවරෙත්තිනරාසා හරිහරකුමාර් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින්ද ;

මුතූර් ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී සංගරප්පිල්ලෙයි සුදාකරන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් නවරෙත්තිනරාසා හරිහරකුමාර්, මුතූර් ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. සුදාකරන්,
තේරීම්භාර නිලධාරී,
මුතූර් ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ත්‍රිකුණාමලය.

12 - 121

1A - G 29001 — 17 (2018/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*